# මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය පිළිබඳ හැඳින්වීමක්

**බෝදාගම සුමන හිමි**

**සංක්ෂිප්තය**

සූචිකරණය (Cataloging) පුස්තකාල තාක්ෂණික සේවා ගණයට අයත් වැදගත් අංගයකි. පුස්තකාල සූචිය තුළින් උපයෝජකයන්ට කර්තෘ, ග්‍රන්ථනාම, වර්ග අංක හා විෂය ශීර්ෂ භාවිත කරමින් ස්වකීය තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කරගත හැකිය. සාම්ප්‍රදායික පුස්තකාල සූචිය අකාරාදි හා වර්ගීකෘත යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට යටත්ව පිළියෙල කෙරේ. අකාරාදි සූචිය භාවිතයෙන් උපයෝජකයාට කර්තෘ හා ග්‍රන්ථනාම ශීර්ෂ ඔස්සේ පුස්තකාල සම්පත් වෙත ප්‍රවේශ විය හැකි අතර ම, වර්ගිකෘත සූචියෙන් වර්ග අංකවලින් නිරූපිත විෂය ශීර්ෂ උපයෝගී කරගනිමින් ඊට අදාළ විෂය ක්ෂේත්‍ර වෙත ළඟා විය හැකිය. වර්තමානයේ බොහෝ පුස්තකාල ස්වයංක්‍රීයකරණය (Automation) කර තිබීම නිසා, සාම්ප්‍රදායික සූචි කැබිනෙට්ටු වෙනුවට මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය (Online Public Access Catalogue) භාවිත කොට පුස්තකාල සම්පත් පහසුවෙන් හා ඉක්මනින් අත්පත් කර ගත හැකි වේ. ඒ අනුව මාර්ගගත පාඨක ප්‍රවේශ සූචිය යනු පුස්තකාල එකතුව වෙත ප්‍රවේශ විය හැකි විද්‍යුත් දොරටුවක්; පුස්තකාල සම්පත් බාහිරට නිරාවරණය කරන මෙවලමක්; එසේම මාර්ගගත දත්ත ගබඩාවක් ලෙස ද හැඳින්විය හැකිය. මෙම ලිපියේ මුඛ්‍ය අරමුණ වන්නේ, මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය පිළිබඳ විමර්ශනයක යෙදීමයි.

**ප්‍රමුඛ පදඃ** පුස්තකාල සම්පත්, මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය, ස්වයංක්‍රීයකරණය, සූචිකරණය,

**මාර්ගගත පොදු ප්‍රවේශ සූචියඃ හැඳින්වීම**

නූතන තාක්ෂණික දියුණුව නිසා සෑම විෂය ක්ෂේත්‍රයකම සංවර්ධනය හා ප්‍රගමනය සීඝ්‍රව සිදු වූ බව පැහැදිලි කරුණකි. පුස්තකාල පද්ධතියෙහි ද ඇති වූ නව ප්‍රවනතා බොහෝය. ඒ අතුරින්

පුස්තකාල ස්වයංක්‍රීයකරණය ඉන් ප්‍රධාන වන අතර, එහි ප්‍රධාන සේවාවක් ලෙස මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය (OPAC) හඳුනාගත හැකිය. මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය පුස්තකාලය සතු සම්පත් බාහිර සමාජයට නිරාවරණය කරන ප්‍රවේශයක්, තොරතුරු මූලාශ්‍රය පිළිබඳ මාර්ගෝපදේශ සපයන විද්‍යුත් දත්ත පදනමක් ලෙස ක්‍රියාත්මක වේ (**Chan, 1985: 9-29p.**). පහතින් මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය පිළිබඳ නිර්වචන කිහිපයක් දක්වා තිබේ. එනම්,

"It is time to start thinking of the Online Public Access Catalogue as an intelligent gateway to diverse, integrated information specialist and the library patron or and user; a gateway accessible not only in libraries but at places of work; study; leisure and the home. Perhaps someday the online catalogue will just be called 'my online library" (**Hildreth: 1985**).

"පරිගණක පාදක සහ සහය දක්වන පුස්තකාල සූචිය මගින් (ග්‍රන්ථවිද්‍යාත්මක දත්ත පදනම) පුස්තකාල පරිශීලකයන්ට, විශේෂ පුහුණුව ලත් පුස්තකාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුගේ සහයක් නොමැතිව ම ග්‍රන්ථවිද්‍යාත්මක දත්ත පදනමට පර්යන්ත (ටර්මිනලය) හරහා පහසුවෙන් ප්‍රවේශ විය හැකිය" (**The ALA Glossary of Library and Information Science: 2000**).

"ස්ථානීයව පිහිටු වා ඇති පරිගණක භවිතයෙන් උපයෝජකයන්ට පුස්තකාලයක සිට හෝ වෙනත් ඕනෑම තැනක ඉඳිමින් මාර්ගතව සපයා ඇති අතුරු මුහුණත් භාවිත කොට මාර්ගගත පාඨක ප්‍රවේශ සූචිය පරිශීලනය කළ හැකි වේ" (**SIRSI Glossary of terms**).

මේ අනුව උපයෝජකයන්ට මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය (OPAC) තුළින් තමන් අභිමත වේලාවක, ඕනෑම තැනක සිට, කිසිවෙකුගේ මඟපෙන්වීමකින් තොරව, පරිගණකයක්, දුරකථනයක් හෝ ටැබ් යන්ත්‍රයක් භාවිත කරමින් මාර්ගගතව (Online) ග්‍රන්ථවිද්‍යාත්මක දත්ත පදනම (Bibliographic Records) පරිශීලනය කර, තම තොරතුරු අවශ්‍යතාව සපුරා ගැනීමට අවැසි මාර්ගෝපදේශ (ප්‍රවේශ) ලබා ගත හැකිය.

**මාර්ගගත පොදු ප්‍රවේශ සූචියේ සංවර්ධන අවධි**

පුස්තකාල ස්වයංක්‍රීයකරණයෙන් පුස්තකාලයකට තම පාඨක ප්‍රජාව උදෙසා ලබා දිය හැකි සුවිශේෂී සේවාවක් වන්නේ මාර්ගගත පොදු ප්‍රවේශ සූචියයි. මාර්ගගත පොදු ප්‍රවේශ සූචියෙහි (OPAC) උපයෝගීතාවය පිළිබඳ විමසා බැලීමේ දී, එය ක්‍රමිකව සංවර්ධනය වූයේ කෙසේදැයි විමසා බැලීම වැදගත්ය. මුල් අදියරට (1960 - 1979) අයත් හැටේ දශකය තුළ පුස්තකාල ස්වයංක්‍රීයකරණය සඳහා සිදු කරන ලද පර්යේෂණාත්මක අත්හදා බැලීම් කිහිපයක් පිළිබඳ තොරතුරු අනාවරණය වේ. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂ 1975 දී ඔහියෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයත් (Ohio State University), වර්ෂ 1978 දී ඩලස් මහජන පුස්තකාලයත් (Dallas Public Library) මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය වඩාත් සංවර්ධිත මුහුණුවරකින් ඉදිරිපත් කරන්නට සමත් විය. මුල්කාලීනව මාර්ගගත සූචියෙන් ලබා දුන් ප්‍රවේශ සාම්ප්‍රදායික කාඩ්පත් සූචි ප්‍රවේශවලට බෙහෙවින් සමාන වේ. එනම් කර්තෘ, ග්‍රන්ථනාම, ඇමතුම් අංක, වර්ග අංක හා ඇතැම් අවස්ථාවල විෂය ශීර්ෂ පමණක් ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රවේශ ලෙස භාවිත කිරීමට අවස්ථාව ලබා දී තිබූ අතර, පාඨකයන්ට මාතෘකාවක් හෝ විෂය ශීර්ෂයක් සොයා ගැනීමට අවම වශයෙන් මාතෘකාවේ හෝ විෂයෙහි මුල් වාක්‍යාංශය අනිවාර්යෙන් ම ඇතුළත් කිරීමට සිදු විය.

මාර්ගගත පොදු ප්‍රවේශ සූචියෙහි (OPAC) දෙවන අදියර වර්ෂ 1980 න් පසුව ආරම්භ වන බව විෂය ප්‍රවීණයන්ගේ අදහසයි. මෙම අවධියේ දැකිය හැකි සුවිශේෂීත්වය වන්නේ, පද්ධති විශේෂඥයන් විසින් සරල මෙන් ම සවිස්තර බහුවිධ ගවේෂණයන්ට අවස්ථා හිමිකරවමින්, යොමුපද ගවේෂණ (Keyword Searching), වදන් ගවේෂණය (Phrase Searching) හා බූලියන් ගවේෂණ (Boolean Searching) මගින් තොරතුරු වෙත ප්‍රවේශ වීමේ පරිශීලක අතුරු මුහුණත් ලබා දීමට හැකිවන පරිදි මාර්ගගත පාඨක ප්‍රවේශ සූචිය සංවර්ධනය කර තිබීමයි (**Matthews: 1991, 5-16p.**). එමගින් උපයෝජකයන්ට නිශ්චිත වචනයක් හෝ වාක්‍ය කාණ්ඩයක් ඇතුව හෝ නැතිව, මාතෘකාවක හෝ විෂයක මැද වචනයක්, වෙනත් ආශ්‍රිත පදයක් භාවිත කරමින් අදාළ මූලාශ්‍රය සොයා ගැනීමට අවශ්‍ය ප්‍රවේශ ලබා දී ඇත. දෙවන අදියරට අයත් මෙම කාලපරිච්ඡේදය තුළ දී බොහෝ විඥාපන ආයතන හා තොරතුරු මධ්‍යස්ථාන අනුකලිත

වාණිජ මෘදුකාංග භාවිත කිරීමට යොමු වන ආකාරයක් ද දැකිය හැකිය (**Tedd: 1994, 27-37p.**).

පරිගණක පද්ධති, ජාලකරණය, මෙහෙයුම් පද්ධති හා මෘදුකාංග, දත්ත ඇතුළත් කිරීමේ මාර්ක් ආකෘතිය (MRAC) යනාදි දෘඩාංග හා මෘදුකාංග සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස මාර්ගගත පොදු ප්‍රවේශ සූචියෙහි නව දිශානතියක් වර්ෂ 1996 න් පසුව ආරම්භ විය (**Voon: 2003**). එනම්, තෙවන අදියරේ දී සරල, පරිශීලක හිතකාමී හා චිත්‍රක අතුරු මුහුණත් (GUI) භාවිතයෙන් කර්තෘ නාම, ග්‍රන්ථ නාම, විෂය ශීර්ෂ, කාලවකවානු, ප්‍රමිත අංක, භෞතික ස්වභාව අනුව තොරතුරු වෙත ප්‍රවේශ වීමේ පරාසය තව දුරටත් පුළුල් විය. ඒ අනුව මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය, වෙබ් පාදක මාර්ගගත පාඨක ප්‍රවේශ සූචියක් (Web-based OPAC) දක්වා සංවර්ධනය වීම, සූචිකරණ ඉතිහාසයේ පරිවර්තනීය වෙනසක් ලෙස පෙන්වා දිය හැකිය.

**සාම්ප්‍රදායික හා මාර්ගගත පොදු ප්‍රවේශ සූචියෙහි ලක්ෂණ**

සාම්ප්‍රදායික සූචි කැබිනෙට්ටුවක හා මාර්ගගත පොදු ප්‍රවේශ සූචියක් අතර දැකිය හැකි සමානතා කිහිපයකි; එසේම අසමානතා බොහෝය. මෙහි දී සාම්ප්‍රදායික හා මාර්ගගත පොදු ප්‍රවේශ සූචියෙහි සැකැස්ම, භෞතික ස්වරූප, අන්තර්ගතය, ලබා දෙන තොරතුරු, සෙවුම් පැතිකඩ (**Sridhar: 2004, 175-183p.**) ආශ්‍රයෙන් සන්සන්දනාත්මක විස්තරයක් පහතින් දක්වා ඇත.

**සාම්ප්‍රදායික හා මාර්ගගත පොදු ප්‍රවේශ සූචියෙහි අනන්‍යතා ලක්ෂණ**

වගු අංකය: 01

| සාම්ප්‍රදායික සූචිය | මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය |
|---|---|
| අකාරාදි සූචියෙන් කර්තෘ, ග්‍රන්ථනාම ප්‍රවේශ හා වර්ගීකෘත සූචියෙන් විෂය ප්‍රවේශ පමණක් ලබා දෙයි | කර්තෘ, මාතෘකා, විෂය, ඇමතුම් අංක, ප්‍රමිත අංක (ISBN, ISSN), ප්‍රමුඛ පද යනාදි බහුවිධ ප්‍රවේශ ලබා දෙයි |
| සූචි කැබිනෙට්ටු ස්ථාපනය කිරීමට වැඩි ඉඩක් අවශ්‍ය වේ | පරිගණක කිහිපයක් පමණක් භාවිත වන නිසා වැඩි ඉඩක් අවශ්‍ය නොවේ |

| | |
|---|---|
| සූචි සංලේඛ සකස් කිරීමට වැඩි කාලයක් මෙන්ම, මිනිස් ශ්‍රමයක් ද අවශ්‍යය | සීමිත සේවක පිරිසක් යොදා ගනිමින් අඩු කාලයකින් වැඩි දත්ත ප්‍රමාණයක් ඇතුළත් කළ හැකිය |
| භාවිත කිරීම තරමක් අපහසුය | ප්‍රමුඛ පද භාවිත කර ඉක්මනින් තොරතුරු වෙත ප්‍රවේශ විය හැකිය |
| සූචි සංලේඛයක ඇතුළත් කළ දත්ත වෙනස් කිරීම අපහසුය | දත්ත වෙනස් කිරීමට හා නැවත ප්‍රතිස්ථාපනය ඉතා පහසුවෙන් සිදු කළ හැකිය |
| බොහෝ පුස්තකාල දැනටමත් භාවිතයෙන් ඉවත් කර හෝ ඉවත් කරමින් සිටිති | බොහෝ පුස්තකාල දැනටමත් භාවිත කරන අතර අනෙකුත් පුස්තකාල ඊට අනුගත වෙමින් පවතී |
| සූචිය අකාරාදීව හා වර්ග අංක අනුපිළිවෙළින් ගොනු කර ඇත | මාර්ගගත දත්ත පදනමක් වන නිසා අනුපිළිවෙළින් ගොනු කිරීමට අවශ්‍ය නොවේ |

මීට අමතරව මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය තුළින් යම් ග්‍රන්ථයක් පිළිබඳ සම්පූර්ණ ග්‍රන්ථ විස්තරයක් ලබා දෙන අතර ම, එම පොත දැනට පුස්තකාලයේ තිබේ ද? තිබේ නම්, එම අංශය හා රාක්ක අංකය පිළිබඳ අතිරේක තොරතුරු ද ලබා දේ. එසේම අන්තර් පුස්තකාල පිරුළු සේවා ක්‍රියාත්මක කිරීමේ දී, අනුබද්ධ සියලු පුස්කාල සඳහා ඒකාබද්ධ සූචියක් නිර්මාණය කර ගැනීම ද පහසුවෙන් සිදු කර ගත හැකි වීම අතිරේක වාසියකි.

**වෙබ් පාදක මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය (Web OPAC)**

වෙබ් පාදක මාර්ගගත පාඨක ප්‍රවේශ සූචිය යනු මාර්ගගත පාඨක ප්‍රවේශ සූචියෙහි ම තවත් එක් දිගුවක් ලෙස හැඳින්විය හැකිය. මුලර් විසින් මාර්ගගත පාඨක ප්‍රවේශ සූචිය ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක ව්‍යාප්ත වෙබ් ප්‍රොටෝකොලයක් (World Wide Web protocol) හෙවත් සෙවුම් යන්ත්‍ර භාවිත කරයි නම් එය මෙනමින් හඳුන්වන බව ප්‍රකාශ කර තිබේ. “A Web OPAC uses the World Wide Web protocol to act as an OPAC” (Mueller, 2002) තව ද මාර්ගගත **පුස්තකාල හා විඥාපන විද්‍යා** ශබ්දකෝෂයෙහි “An Online Public

Access Catalogue (OPAC) uses a graphical user interface (GUI) accessible via the World Wide Web, as opposed to a text based interface accessible via telnet" යනුවෙන් වෙබ් පාදක මාර්ගගත පාඨක ප්‍රවේශ සූචියෙන් ටෙල්නෙට් හරහා ප්‍රවේශ විය හැකි; පෙළමත පදනම් වූ අතුරු මුහුණත් වෙනුවට, සෙවුම් යන්ත්‍රවලින් ප්‍රවේශ විය හැකි; චිත්‍රක අතුරු මුහුණත් ලබා දෙන බව විස්තර කර ඇත. මේ අනුව මාර්ගගත පාඨක ප්‍රවේශ සූචියෙහි හා වෙබ් පාදක මාර්ගගත පාඨක ප්‍රවේශ සූචියෙහි යම් යම් වෙනස් කම් ඇති බව පැහැදිලි වේ. ඒ අනුව,

**මාර්ගගත හා වෙබ් පාදක පොදු ප්‍රවේශ සූචියෙහි සම අසමතා**

**වගු අංකඃ 02**

| මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය | වෙබ් පාදක මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය |
|---|---|
| ජාල ගත පරිසරයක දී ස්ථානීය පරිගණක භාවිතයෙන් දත්ත පදනමට ප්‍රවේශ විය හැකිය | මාර්ගතව ඕනෑම ස්ථානයක සිට දත්ත පදනමට ප්‍රවේශ විය හැකිය |
| සීමිත පිරිසකට සීමා වේ | අසීමිතව ප්‍රවේශ විය හැකිය |
| මෘදුකාංග වැඩසටහන අනුගමනය කරමින් මූලාශ්‍රය පිළිබඳ තොරතුරු පමණක් ලබා ගත හැකිය | අධි සැබඳි (hyperlink) ලබා දිය හැකිය |
| නිශ්චිත වෙලාවක භාවිත කළ යුතුය | දවසේ ඕනෑම වේලාවක භාවිත කළ හැකිය |

උපයෝජකයන්ට තම නිවසේ සිට ම වෙබ් පාදක මාර්ගගත පාඨක ප්‍රවේශ සූචිය භාවිත කරමින් පොත් භාරදිය යුතු දින අලුත් කරගැනීමට (Renewal) හා වෙන් කර ගැනීමට හැකි වීම මෙහි ඇති සුවිශේෂී සේවාවක් ලෙස පෙන්වා දිය හැකිය.

**සමාලෝචනය**

පුස්තකාලයකට සූචිය (Catalogue) අත්‍යවශ්‍ය ම අංගයකි. සූචිය තුළින් පුස්තකාලය තුළ ඇති සම්පත් බාහිරට නිරාවරණය

කරන අතර, උපයෝජකයන්ට එම සම්පත් වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය ග්‍රන්ථවිද්‍යාත්ම තොරතුරු ලබා දේ. සූචියේ ස්වරූපය අනුව, එහි අභ්‍යන්තර හා බාහිර යනුවෙන් කොටස් දෙකකි. ඉන් මුද්‍රිත සූචි, තුණ්ඩු මිටි සූචි, කාඩ් සූචි අයත් වන්නේ සාම්ප්‍රදායික සූචි කාඩ්පත් ගණයට ය. සාම්ප්‍රදායික සූචිය අකාරාදිව හා වර්ගීකෘතව ගොනු කළ හැකි අතර, උපයෝජකන්ට පුස්තකාලයට පිවිස සාම්ප්‍රදායික සූචි කැබිනෙට්ටුව උපයෝගී කරගනිමින් තොරතුරු වෙත ප්‍රවේශ විය හැකිය. වර්ෂ 1960 න් පසුව පුස්තකාල කටයුතු ද පරිගණක ගත කිරීම නිසා, මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය හඳුන්වා දීමත් සමඟ පුස්තකාල ක්ෂේත්‍රයේ විශාල දියුණුවක් ඇති වූ බව නොරහසකි. එයින් පාඨකයන්ට වැඩි වෙහෙසකින් තොරව ම පුස්තකාල සම්පත් වෙත ප්‍රවේශ වීමේ අවස්ථා පුළුල් විය. වර්තමානයේ වෙබ් පාදක මාර්ගගත පොදු ප්‍රවේශ සුචිය තුළින් උපයෝජකයන්ට පුස්තකාලයට නොගොස්, ඕනෑම ස්ථානයක සිට, ඕනෑම වේලාවක, ග්‍රන්ථවිද්‍යාත්මක දත්ත පදනම ගවේෂණය කිරීම දක්වා පුස්තකාල සූචිය සංවර්ධනය වී ඇති බව ඉහත පැහැදිලි කිරීමෙන් මනාව පසක් වේ.

### ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය


Chan, L. M. (1985). **Cataloguing and classification: An introduction.** New York: McGraw-Hill.

Hildreth, Charles. R., (1985). **Online Public Access Catalogs.** Ed: Martha E. Williams. Annual Review of Information Science and Technology (ARIST), New York: Knowledge Industrial Inc. Vol. 20, pp. 232-285.

Matthews, J. R. (1991). **The Online catalog**: Time to move beyond the boundary of a catalog. In N. V. Pulis (Ed.), Think Tank on the Present and Future of the Online Catalog Chicago: American Library Association. 5-16p.

Sridhar, M. S. (2004). **OPAC vs. Card Catalogue: A Comparative Study of User Behavior. The Electronic Library,** Vol. 22, n. 2, 175-183p.

Tedd, L. (1994). **OPACs through the ages. Library' Review**, 43 (4), 27-37p.

Voon, J. (2003). **LIBR 510 Critical Responses.** (Number 1&2). Retrieved on February 22, 2008 from http:// www.slais.ubc.ca people students resumes .1 Voon Docs 510 critresp.pdf